# "නයිටා" සහ Top Jobs අවබෝධතා ගිවිසුම අත්සන් කරයි

topjobs
recruitment made easy

NATTA

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වත්මන් රැකියා වෙළඳ පලට උචිත ආකාරයෙන් ආධුනිකයින් හට විධිමත් න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙමින් වසරකට 30000 කට ආසන්නවූ ආධුනිකයින් සංඛ්‍යාවක් සමාජයට දායාද කරනු ලබන අතර, වගකීමක් ඇති රාජ්‍ය ආයතනයක් වශයෙන් නයිටා ආයතනය ස්වකීය පුහුණුවීම් සාර්ථකව නිමකරන ආධුනිකයින් සඳහා සුදුසු රැකියාවක් සොයාදීමේ මෙතෙක් පැවැති ක්‍රියාදාමට අමතරව, ගරු සභාපති අමල් සේනාලංකාධිකාර මැතිතුමාගේ සංකල්පයක් අනුව නවීන ලෝකයට ගැළපෙන අයුරින් රැකියා පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා අන්තර් ජාලය හා සම්බන්ධ රැකියා ජාලයක් සමඟ නයිටා ආයතනය සම්බන්ධ වී ඇත.

එනම් රැකියා ජාලයන්ගේ මුල්තැන ගන්නා ජෙනිසිස් සොෆ්ට්වෙයා(ර්) පුද්ගලික සමාගම මගින් පවත්වාගෙන යනු ලබන **Top Jobs** සමඟ පසුගියදා වැලිකඩ, රාජගිරියේ පිහිටි නයිටා ප්‍රධාන කාර්යාලයේදී ගිවිසුමක් අත්සන් තැබිණි. මෙහිදී ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වෙනුවෙන් එහි සභාපති **අමල් සේනාලංකාධිකාර මැතිතුමාත්, ජෙනිසිස් සොෆ්ට්වෙයා(ර්) ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂ සේනක විරසූරිය මහතාත් අත්සන් තැබූ අතර,** මෙම ගිවිසුම මගින් සිදුවන මෙහෙය පිළිබඳ කෙටි සාකච්ජාවක් ද මෙහිදී පැවැත්විණි.

මේ අනුව නයිටා පුහුණුවීම් සාර්ථකව නිමකරන ආධුනිකයින **Top Jobs** වෙබ් අඩවියට ඇතුළත් කරගන්නා අතර, රාජ්‍ය හා පුද්ගලික ආයතනයන්හි පවත්නා ඒ ඒ රැකියා පුරප්පාඩු සඳහා සුදුසුකම් දරණ ආධුනිකයින් එම රැකියා සඳහා යොමුකිරීමට **Top Jobs** වෙබ් අඩවිය කටයුතු කරයි. එනම් යම් ආයතනයක දැන්වීමක් පලකිරීමේ සිට සුදුසුකම් ලත් ආධුනිකයින් හට රැකියාවක් සොයාදීම දක්වා අතරමැදි කාර්ය භාර්ය **Top Jobs** වෙබ් අඩවිය සිදුකරනු ලබයි. මෙම ගිවිසුමේ සාර්ථකත්වය කියා පාමින් මේ වන විට ආධුනිකයින් 75 දෙනෙකු රැකියා අවස්ථා සඳහා යොමුකර ඇති අතර, එය සංකේතවත් කරමින් ආධුනිකයින් 4 දෙනෙකු සඳහා රැකියා සඳහා යොමුකිරීමේ ලිපි ලබාදීමක් ද මෙහිදී සිදුවුනි.

රැකියා අපේක්ෂිත ආධුනිකයින් සඳහා www. topjobs.lk යන වෙබ් අඩවියට පිවිසීම තුළින් ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරාම රැකියා පිළිබඳ තොරතුරු නොමිලේ කඩිනමින් දැනගැනීමේ හැකියාව ආධුනිකයින් හට උදාවී ඇත. මේ ආකාරයට ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ස්වකීය පුහුණුවීම් සාර්ථකව නිමකරන ආධුනිකයින් සඳහා රැකියා සොයාදීමේ වගකීම ද ඉටුකරනු ලබන රාජ්‍ය ආයතනයක් වශයෙන් හඳුන්වාදීම අතිශෝක්තියක් නොවනු ඇත.